පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 7 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- භූගෝල විද්‍යාව I,II

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ................................ කාලය :

## භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි:-**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

01) පෘථිවි ආදර්ශ ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන .................................................... කි.
( 560 / 510 / 570 )

02) ශ්‍රී ලංකාවේ වියලි හා අර්ධ ශුෂ්ක කලාප වල .................................................... දැකිය හැකිය.
( කටු පඳුරු සහිත ලඳු කැලෑ / කඩොලාන / තෘණ තලාවන් )

03) දකුණු ආසියාතික කලාපයේ රටවල් අතුරින් ශ්‍රී ලංකාව සාක්ෂරතාවයෙන් දෙවෙනි වන්නේ ........................................................................... පමණි.
( ඉන්දියාවට / පාකිස්තානයට / මාලදිවයිනට )

04) කැරිබියන් මුහුද අයත් වන්නේ ........................................................................... සාගරයටයි.
( ඉන්දියන් / පැසිෆික් / අත්ලාන්තික් )

05) වාණිජ පදනමකින් එළවළු, පලතුරු හා මල් වගාව සිදු කෙරෙනුයේ,....................................................
( කඳුකර ප්‍රදේශය / වෙරළබඩ ප්‍රදේශ / අභ්‍යන්තර තැනිතලාවේය )

- **අංක 06 සිට 10 තෙක් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ නිවැරදි නම් එය ඉදිරියෙන් ලකුණ ද වැරදි නම් ලකුණ ද යොදන්න.**

06) කැස්පියන් මුහුද හා ඒරල් මුහුද ආසියා මහද්වීපය තුළ පිහිටා ඇත. (............)

07) ජනවාරි හා දෙසැම්බර් මාසවල ශ්‍රී ලංකාවට සාමාන්‍යයෙන් වියලි කාලගුණ තත්වයක් පවතී. (............)

08) සිතියමක් කියවීම සඳහා සූචකය අවශ්‍ය වේ. (............)

09) මුහුදේ සිදුවන භූමි කම්පා සුනාමි තත්ත්වයක් ඇති වීමට බලපායි. (............)

10) තෙත් කලාපීය භූ දර්ශන නිරතුරුව වෙනස් වේ. (............)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

11) ශේෂ කන්දක් වූ ............................................. පුරාණයේ සිටම ආරක්ෂක බල කොටුවක් ලෙස ද ප්‍රකටය.

12) පෘථිවි අභ්‍යන්තරයේ ඇති අධික උෂ්ණත්වය හා පීඩනය වෙනස්කම් හේතු කොට ගෙන ............................................. ඇති වේ.

13) වෙරළ මායිමේ සිට සැතපුම් 12 ක මුහුදු සීමාව ............................................. ලෙස හඳුන්වයි.

14) භූමියේ ඇති සියළුම දෑ එම ප්‍රමාණයටම ඇඳීමට අපහසු නිසා සිතියම් නිර්මාණයේ දී කිසියම් ............................................. භාවිතා කරයි.

15) ආසන්න වට පිටාව පදනම් කරගෙන යම් කිසි රටක පිහිටීම දැක්වීම ............................................. පිහිටීම ලෙස හඳුන්වයි.

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16) ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපය ආසන්නයේ පිහිටි දූපතක් වන්නේ,

i. කයිට්ස්
ii. මන්නාරම
iii. චුන්ඩිකුලම්
iv. පරෙවි දූපත

17) ශ්‍රී ලංකාවේ පවතින මානව නිර්මිත ලෝක උරුමය මින් කුමක් ද?

i. නල්ලූර් කෝවිල
ii. ෆෙඩ්රික් කොටුව
iii. දඹුලු විහාරය
iv. පේරාදෙනි උද්භිත උද්‍යානය

18) ශ්‍රී ලංකාවට සංවහන වර්ෂාව ලැබෙන කාල වකවානුව වනුයේ,

i. මැයි, ජූනි
ii. නොවැම්බර්, දෙසැම්බර්
iii. මාර්තු, අප්‍රේල්
iv. ඔක්තෝම්බර්, නොවැම්බර්

19) ලෝකයේ විශාලත්වයෙන් අඩුම (කුඩාම) සාගරය වන්නේ,

i. පැසිපික් සාගරය
ii. ආක්ටික් සාගරය
iii. ඇන්ටාක්ටික් සාගරය
iv. අත්ලාන්තික් සාගරය

20) ගෝලීය දේශගුණික වෙනස්වීම් ඇති වීමට බලපාන හේතුවක් නොවන්නේ මින් කුමක් ද?


i. වනාන්තර විනාශ කිරීම
ii. වායුගෝලය උනුසුම් වීම
iii. අව්ධිමත් ඉදිකිරීම්
iv. කෘෂි හා කාර්මික අපද්‍රව්‍ය ගිනිම්

# භූගෝල විද්‍යාව II

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

01) අ) දී ඇති ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.



i. ජාත්‍යන්තර දින රේඛාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii. රතු මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද?


iii. ඕස්ට්‍රේලියා මහද්වීපය දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv. ඇමරිකා එක්සත් ජනපදය දැක්වෙන අක්ෂරය කුමක් ද?

v. ජපානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

vi. ඉන්දියන් සාගරය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 6)

ආ) දී ඇති ලංකා සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.



i) යාපනය දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii) කුරුණෑගල දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

iii) කැළණි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv) සිංහරාජ වනාන්තරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

v) කෝනේෂ්වරම් කෝවිල පිහිටි ස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

vi) මන්නාරම් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 6)

02) i) සපයා ඇති රූප සටහනෙහි A හා B නම් කරන්න. (ලකුණු 2)


ii) අක්ෂාංශ හා දේශාංශ කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 4)


iii) ඉහත රූප සටහනේ පහතින් දක්වා ඇතිත අගයන් සහිත රේඛා හඳුන්වන නම් සඳහන් කරන්න.

අ) x අක්ෂාංශ 0 රේඛාව

උතුරු අක්ෂාංශ 23 1/2 (ලකුණු 2)

ආ) පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 4)





03) i) ඉහත දක්වා ඇති ලංකා සිතියමෙහි A හා B අක්ෂරවලින් පෙන්වා ඇති භූ විෂමතා කලාප 2 නම් කරන්න. (ලකුණු 2)

ii) C කලාපයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii) අ) ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය භූ දර්ශන ආශ්‍රිතව සිදු කරන වගාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ආ) එම කලාපය තුල මිනිසා විසින් පරිසරයට සිදු කරන හානි සහ මතුව ඇති ගැටලු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

04) i. ශ්‍රී ලංකාව තුල වෙසෙන සිංහල හැර වෙනත් ජන වර්ග 2 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. ජාතික උරුම ( සංස්කෘතික උරුම ) බෙදා දක්වන ප්‍රධාන වර්ග 2 ක් නම් කර ඒ සඳහා උදාහරණ 1 බැගින් සපයන්න. (ලකුණු 4)

iii. රටක ජනතාවට පහත සඳහන් පහසුකම් ලබා දීමෙන් පසු සැලසෙන වාසි 1 බැගින් ලියන්න.

- පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම
- අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීම
- වෛද්‍ය හා සෞඛ්‍ය සේවයේ පහසුකම් වැඩි දියුණු කිරීම (ලකුණු 6)

05) i. වියලි කලාපීය භූ දර්ශන තුල දැකිය හැකි වනෝද්‍යාන 2 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. වියලි කලාපීය භූ දර්ශනයන් නිර්මාණය වීමට බලපාන සාධක 2 ක් ලියන්න. (ලකුණු 4)

iii. අ) මෙම කලාපය තුල පිහිටි නිරතුරුවම වන්දනා මාන කරන විවිධ ආගමික ස්ථාන 2 ක් නම් කරන්න.

ආ) වියලි කලාපයේ ජල හිගයට ගෙන ඇති විසඳුම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

06) i. ශ්‍රී ලංකාවට නියගය බලපාන දිස්ත්‍රික්ක 2ක් නම් කරන්න. (ලකුණු 2)

ii. නියගය නිසා මිනිසාට ඇතිවන බලපෑම් 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. නියගය නිසා පරිසරයට සිදුවන බලපෑම් 3 ක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 6)

07) i. ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව්‍ය 2 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. උපද්‍රව හා ආපදා අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. අ) ආපදා කළමනාකරණ චක්‍රයේ අවස්ථා 3 ක් නම් කරන්න. (ලකුණු 3)

ආ) ඉන් එක් අවස්ථාවක කටයුතු කල යුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2022

භූගෝල විද්‍යාව - 7 ශ්‍රේණිය

# පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 510 | 02. | කටුපදුරු සහිත ලඳු කැලෑ | 03. | මාලදිවයිනට | 04. | අත්ලාන්තික් |
| 05. | කඳුකර ප්‍රදේශයේ | 06. | ✓ | 07. | × | 08. | ✓ |
| 09. | ✓ | 10. | ✓ | 11. | සීගිරිය | 12. | භූමිකම්පා |
| 13. | රාෂ්ට්‍රිය මුහුදු සීමාව | 14. | පරිමාණයක් | 15 | සාපේක්ෂ පිහිටීම | 16. | කයිට්ස් |
| 17 | දඹුළු විහාරය | 18. | මාර්තු අප්‍රේල් | 19 | ආක්ටික් සාගරය | | |
| 20 | අවිධිමත් ඉදිකිරීම් | | | | | | |

(2x20=40)

## II පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| i) B | ii) E | iii) L | iv) C | v) K |
| ii) G | ii) B | iii) I | iv) K | v) D |
| vi) E | | | | |

2) i) A ඇන්ටාක්ටික් වෘත්තය

ii) B ආක්ටික් වෘත්තය ( 2 )

අක්ෂාංශ :- පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර සිට බටහිරට තිරස් අතට විහිදෙන රේඛා අක්ෂ

දේශාංෂ :- පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරේ සිට දකුණට විහිදෙන සිරස් රේඛා ( 4 )

අ අක්ෂාංශ 0 සමකය

උතුරු අක්ෂාංශ 23 කර්කටක නිවර්ත රේඛාව ( 2 )

ආ භ්‍රමනය :- පෘථිවිය තම අක්ෂය වටා කැරකීම භ්‍රමනය ලෙස හඳුන්වයි භ්‍රමනය වීමට ගත වන කාලය පැය 24

පරිභ්‍රමනය :- පෘථිවිය තම අක්ෂය වටා කැරකෙමින් සූර්යා වටාද කැරකීම පරිභ්‍රමනය ලෙස හඳුන්වයි පරිභ්‍රමනය වීමට දින 365 ක කාලයක් ගත වේ (මෙම අදහසට සමාන පිළිතුරක්) ( 4 )

(3) i) A- මධ්‍ය කඳුකරය

B- අභ්‍යන්තර තැනිතලාව

ii) බොකු, කලපු, තුඩු, දූපත් වගුරු වැනි වෙරළබඩ කලාපීය ලක්ෂණ 2ක් ( 2 )

iii) (අ) පොල් වගාව/ ගංගා නිම්න වල වී වගාව/ කඳු බෑවුම් වල රබර් හා තේ ( 2 )

(ආ) නාය යෑම්/ භූගත ජල උල්පත් සිඳීයෑම්/ ගොඩනැගිලි ගිලා බැසීම්/ මැසි මදුරු බෝවීම් ආදී ගැටළු

★ මැණික් පතල් කැණීම/ වන විනාශය/ මැටි කැපීම වැනි පරිසරහට හානි කර ක්‍රියාවන් නිසා ඉහත ගැටළු සිදුවන බව යන්න අර්ථ ගැන්වී ඇත්නම් ( 4 )

(4) i) ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් ( 2 )

ii)

| ස්පෘෂ්‍ය උරුම | අස්පෘෂ්‍ය උරුම |
|---|---|
| සිගිරිය | ආගන්තුක සත්කාර |
| රන්මසු උයන | වැඩිහිටියන්ට සැලකීම |
| කතරගම | ගරු සැලකිලි |
| මුස්ලිම් දේවස්ථානය | සිරිත් විරිත් |
| ශ්‍රී මහා බෝධිය | |
| යාපන කොටුව | |
| වැව් ආදී | |

( 4 )

iii) පෝෂ්‍යදායී ආහාර වේල - ලෙඩ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව කායික හා මානසික පෝෂණය වැඩි වීම ආයු අපේක්ෂාව වැඩි දියුණු වීම

වෛද්‍ය හා සෞඛ්‍ය - ආයු අපේක්ෂාව වැඩි වී

ළදරු මරණ අඩු වීම

මාතෘ මරණ අඩු වීම

අධ්‍යාපන පහසුකම් වැඩි වීම - සාක්ෂරතාව වැඩි වීම
ජීවන වියදම ඉහල යෑම
හොඳ රැකියා අවස්ථා ඇති වීම
සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම
යහපත් ආකල්ප ඇති වීම ( 6 )

(5) i) යාල/ විල්පත්තු/ කවුඩුල්ල/ මාදුරු ඔය/ ගල් ඔය/ කුමන/ සෝමාවතිය/ වස්ගමුව

ii)
- දැඩි නියගය
- අධික උෂ්ණත්වය
- අවිනිශ්චිත හා අඩු වර්ෂාපතනය
- ඉහල වාෂ්පීකරණය

(පෙළ පොතේ 31 පිටුව) (මෙම අර්ථයට සමාන අදහස්) ( 4 )

iii) (අ) ජය ශ්‍රී මහා බෝධිය, මඩු පල්ලිය, කෝනේෂ්වරම් කෝවිල, කතරගම ( 2 )

(ආ)
- ★ ගංගා හරස් කර වියලි කලාපයට ජලය ගෙන යෑම හා එම කලාපයේ වැව් පිරවීම
- ★ වැසි ජලය සංරක්ෂණය
- ★ නල ළිං සෑදීම
- ★ කෘෂි ළිං සෑදීම
- ★ විසිරි ජල සම්පාදන ක්‍රමය භාවිතා කිරීම ( 4 )

(6) i) යාපනය/ කිලිනොච්චිය/ මුලතිව්/ මන්නාරම/ වව්නියාව/ ත්‍රිකුණාමලය/ අනුරාධපුර/ පුත්තලම/ පොළොන්නරුව/ මොනරාගල/ හම්බන්තොට ( 2 )

ii)
- ජල හිඟ වීම
- කෘෂි අස්වනු විනාශ වීම
- ආහාර හිඟය
- වසංගත රෝග පැතිරීම ( 4 )

iii)
- පරිසර උෂ්ණත්වය ඉහල යෑම
- භූගත ජල මට්ටම පහළ බැසීම
- ලැව් ගිනි ඇති වීම
- වනාන්තර විනාශය
- ජෛව සම්පත් විනාශ වීම
- පස නිසරු වීම
- පාරිසරික සුන්දරත්වයට හානි පැමිණීම

මෙම කරුණු එකක් පිළිබඳ කෙටි හැඳින්වීමකට ( 6 )

(7) i) නියගය/ ගංවතුර/ නායයෑම්/ සුළි සුළං/ අකුණු සැර/ භූමි කම්පා/ සුනාමි

ii) ස්වාභාවික හෝ මානුෂ ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි ස්වාභාවික සංසිද්ධි උපද්‍රව ලෙස හඳුන්වයි මෙම උපද්‍රව ප්‍රජාවට හෝ දේපළ වලට විනාශකාරී ලෙස බලපාන්නේ නම් එය ආපදාවකි
මෙම අර්ථයට සමාන අදහසකට ( 4 )

iii)
- පෙර සූදානම
- ආපදා අවස්ථාව
- ආපදාවෙන් පසු ( 3 )

ඉහත අවස්ථාවන් වලදී කටයුතු කළ යුතු ආකාරයන් කෙටියෙන් දක්වා තිබීම
(පෙළ පොත 55 පිටුව ආශ්‍රිතව) ( 3 )


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න